(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 55. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 පෙබරවාරි 23 අඟහරුවාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු නසීර් අහමඩ් මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ජගත් කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ :** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2021 පෙබරවාරි මස 17 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**ගෝඨාභය රාජපක්ෂ**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு**
**Democratic Socialist Republic of Sri Lanka**

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධාන සහ 2021 ජනවාරි 07 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ දී තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සහ මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි: –

1. තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා

   ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

   ගරු මයන්ත දිසානායක මහතා

   ගරු ඉම්රාන් මහරූෆ් මහතා

   ගරු යදාමිණී ගුණවර්ධන මහතා

2. මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු සී. බී. රත්නායක මහතා

   ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

   ගරු අකිල එල්ලාවල මහතා

   ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

   ගරු රෝහණ බංඩාර මහතා."

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 සහ 2019 වර්ෂ සඳහා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය මත** තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2020 අංක 6 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2020.12.21 සිට 2020.12.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන; සහ

(ii) 2020 අංක 7 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2021.01.01 සිට 2021.01.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන

ඉදිරිපත් කරන ලදී.

එම ලේඛන, **සභා මේසය මත** තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ ෂැන්ග්‍රි-ලා හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2020 දෙසැම්බර් 18 දිනැති අංක 2206/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2020 දෙසැම්බර් 18 දිනැති අංක 2206/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

පිළිගන්වා එම නියමයන් සහ නියෝග, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(4) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(5) වෙළඳ අමාත්‍යවරයා විසින් 2015 වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කර එම වාර්තාව, වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(6) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(7) සංචාරක අමාත්‍යවරයා විසින්—

(i) 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කරන එම වාර්තා, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි; සහ

(ii) (235 අධිකාරය) වන රේගු ආඥා පනත යටතේ යෝජනාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවෙන් එහි සාමාජික ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2018 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු ප්‍රසන්න රණතුංග මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(ii) 2018 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්; සහ

(iii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය මත** තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) අච්චුවේලි, අච්චුවේලි දකුණ යන ලිපිනයෙහි පදිංචි නාගරාසා පගීරදන් මහතාගෙන් ලැබුණු 2020.12.08 දිනැති පෙත්සම ගරු ඩග්ලස් දේවානන්දා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) ගාල්ල, වක්වැල්ල පාර, අංක 58/8 දරන ස්ථානයෙහි පදිංචි බී. ආර්. විමලසේන මහතාගෙන් ලැබුණු 2020.11.28 දිනැති පෙත්සම; සහ

(ii) බලපිටිය, වැල්ලබඩ පන්සල පාර, ''නිරෝෂා'' යන ලිපිනයෙහි පදිංචි එම්. ජී. විජිත් ජයන්ත මහතාගෙන් ලැබුණු 2021.01.01 දිනැති පෙත්සම

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) අනුරාධපුරය, කුරුන්දන්කුලම, 3 වන පටුමග යන ලිපිනයෙහි පදිංචි ආර්. ඒ. ගාමිණී රණසිංහ මහතාගෙන් ලැබුණු 2020.10.24 දිනැති පෙත්සම;

(ii) ගලෙන්බිඳුනුවැව, කුණුගෝනෑව යන ලිපිනයෙහි පදිංචි ආර්. එම්. අබේසිංහ මහතාගෙන් ලැබුණු 2020.08.15 දිනැති පෙත්සම; සහ

(iii) දෙකටන, පැලහැල, පොල්කොටුව වත්ත, අංක 270 දරන ස්ථානයෙහි පදිංචි ටී. ඒ. ඩී. ටී. සේනානායක මහතාගෙන් ලැබුණු 2020.12.27 දිනැති පෙත්සම

ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) ගම්පොළ, මහර, නැඩිසා නිවාස පාර, අංක 42 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. සුනිල් ජයලත් මහතාගෙන් ලැබුණු 2020.12.30 දිනැති පෙත්සම ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා විසින් පිළිගන්වන ලදී.

(5) බණ්ඩාරගම, වෑවිට, "ශ්‍රී රාජ්" යන ලිපිනයෙහි පදිංචි ජේ. ස්වර්ණලතා මහත්මියගෙන් ලැබුණු 2020.12.05 දිනැති පෙත්සම ගරු තිස්ස අත්තනායක මහතා විසින් පිළිගන්වන ලදී.

(6) මුන්දලම, බරණන්කට්ටුව යන ලිපිනයෙහි පදිංචි එම්. ආර්. නිවුටන් මාරසිංහ මහතාගෙන් ලැබුණු 2020.10.05 දිනැති පෙත්සම ගරු නිරෝෂන් පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(7) තෝරයාය, කොස්කුඹුර යන ලිපිනයෙහි පදිංචි කේ. ආරියරත්න මහතාගෙන් ලැබුණු 2020.12.18 දිනැති පෙත්සම ගරු ජේ. සී. අලවතුවල මහතා විසින් පිළිගන්වන ලදී.

(8) සුල්තානාගොඩ, වරකපිටිය, "ප්‍රදීප්" යන ලිපිනයෙහි පදිංචි එච්. ජී. සිරිසේන මහතාගෙන් ලැබුණු 2021.01.05 දිනැති පෙත්සම ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(9) හෝකන්දර, ඇවරිහේන, අංක 484/8 දරන ස්ථානයෙහි පදිංචි කුඩාගමගේ මාලින් අජන්ත පෙරේරා මහතාගෙන් ලැබුණු 2021.01.19 දිනැති පෙත්සම ගරු ජයන්ත කැටගොඩ මහතා විසින් පිළිගන්වන ලදී.

(10) මොණරාගල, හිදිකිවුල, පන්සල ඉදිරිපිට පාර යන ලිපිනයෙහි පදිංචි ආර්. ඒ. දසනායක මහතාගෙන් ලැබුණු 2020.12.05 දිනැති පෙත්සම ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(11) වත්තේගම, වාවින්න, වලල පාර, අංක 11/1 දරන ස්ථානයෙහි පදිංචි ඩී. ජී. එන්. එම්. දිසානායක මෙනවියගෙන් ලැබුණු 2020.11.12 දිනැති පෙත්සම ගරු ගුණතිලක රාජපක්ෂ මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 1.00 දක්වා විය යුතු ය. අ.භා. 1.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2021 පෙබරවාරි 24 බදාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට පූ.භා. 11.30 දක්වා විය යුතු ය. පූ.භා. 11.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**8. වරප්‍රසාද:** ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2020 නොවැම්බර් 28 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**9. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1) :** ගරු තිස්ස අත්තනායක මහතා, ගරු බුද්ධික පතිරණ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

“සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා කෙටුම්පත බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**10. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2) :** ගරු අමරකීර්ති අතුකෝරළ මහතා, ගරු රෝහණ දිසානායක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

“රොෂාන් රණසිංහ ජනසහන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා කෙටුම්පත සෞඛ්‍ය අමාත්‍යවරිය වෙත යොමු කරන ලදී.

**11. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3) :** ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා, ගරු ඒච්. නන්දසේන මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

“සිසිර ජයකොඩි සියපත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

(පූ. භා. 11.25 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

**12. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග :** විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2021 පෙබරවාරි 10),— "1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 15 වගන්තිය සමඟ කියවිය යුතු, 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

එතැන් සිට විවාදය ඉදිරි දිනයක දී පවත්වනු ලැබේ.

(අ. භා. 12.15 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

**13. කල් තැබීම :** මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ.භා 1.00 වූයෙන් අද දින සභා සම්මතිය අනුව කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 පෙබරවාරි 24 බදාදා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.